# ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
# කොළඹ

## <u>පුවත්පත් නිවේදනය</u>

## <u>INS 'නිරීක්ෂක්' නෞකාව ශ්‍රී ලංකා නාවික හමුද කිමිදුම් පුහුණුවක් සඳහා ත්‍රිකුණාමලයට පැමිණේ</u>

ඉන්දියානු නාවික හමුදාව සතු ඉහළතම කිමිදුම් සහය නෞකාවක් වන INS 'නිරීක්ෂක්' නෞකාව ශ්‍රී ලංකා නාවික හමුදාව වෙනුවෙන් මිශ්‍ර වායු කිමිදුම් පුහුණුවක් ක්‍රියාත්මක කිරීම සඳහා 2022 පෙබරවාරි 28 වන දින ත්‍රිකුණාමලය වරාය වෙත ළ විය.

2. මෙම නෞකාව ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සාම්ප්‍රදායානුකූලව පිළිගන්නා ලදී. ත්‍රිකුණාමලයට ළ වීමෙන් අනතුරුව ඉන්දිය නාවික හමුදාවේ අණදෙන නිලධාරී කපිතාන් මොහොමඩ් ඉක්රාම් මහතා නැගෙනහිර නාවික ප්‍රදේශය භාර අණදෙන නිලධාරී රියර් අද්මිරාල් පී. ඩී. එස්. ඩයස් මහතා හමු විය. ශ්‍රී ලංකාව තුළ ගත කරන දින 10 තුළ කිමිදුම් ක්ෂේත්‍රය තුළ පුහුණු කටයුතු තවදුරටත් ඉහළ නැංවීම සම්බන්ධයෙන් මෙහිදී සාකච්ඡා කරන ලදී.

3. ඉන්දිය නාවික හමුදාවේ 'නිරීක්ෂක්' (A-15) නෞකාව සය දෙනෙකුට රැඳී සිටිය හැකි ප්‍රති සම්පීඩක කුටීර දෙකකින් (recompression chambers) සහ තිදෙනෙකු සඳහා වන කිමිදුම් සීනුවකින් ද (diving bell) සමන්විතය. මෙම නෞකාව පදා අවස්ථාවක දී සබ්මැරීනයක සිට මුදවාගැනීමේ මෙහෙයුම් සිදු කිරීමට ද ඉතා ගැඹුරු මුහුදේ කිමිදෙන කිමිදුම්කරුවන්ගේ පුහුණුවීම් සිදු කිරීමට ද සියලු පහසුකම් වලින් සමන්විත වේ. මෙම නෞකාව ශ්‍රී ලංකා නාවික හමුදා කිමිදුම්කරුවන්ගේ මෙවැනි පුහුණුවක් සඳහා 2019 සැප්තැම්බර් මාසයේදී ද ත්‍රිකුණාමලයට පැමිණියේය. ශ්‍රී ලංකා නාවික හමුදාව සම ඉන්දිය නාවික හමුදා නෞකාවන්හි මෙවැනි අඛණ්ඩ ක්‍රියාකාරකම් ඉන්දියානු රජයේ 'අසල්වැසියා ප්‍රථමයෙන්' යන ප්‍රතිපත්තිය යටතේ ධාරිතාවයන් ගොඩනැගීමේ ප්‍රයත්නයන්ට සමගාමීව ක්‍රියාවට නැංවේ.

*****

Colombo
28 February 2022